**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව - 2018**

-----------------------------------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවෙහි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම,අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය පුකාශන පිළියෙළ කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම,කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානු වලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරන තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් “මනා ලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරන පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 49 වන ඡේදය ප්‍රකාරව කිසියම් දේපල, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විට එම වත්කම් අයත් වන දේපල, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද සභාවට අයත් පිරිවැය රු.15,129,207 ක් වූ වත්කම් අතරින් අයිතම 06 ක එකතුව රු.728,530 ක් වූ වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. | 2018 වර්ෂයේදී කිසිදු වත්කමක් ප්‍රත්‍යාගණනය නොකරන ලදී. ඊට පෙර වර්ෂවලදී කරන ලද ප්‍රත්‍යාගණනය කිරීම් වලදී මෙම වරද සිදුවී ඇති අතර ඉදිරි ප්‍රත්‍යාගණනයේදී ප්‍රමිතියට අනුකූලව කිරීමට උපදෙස් දෙන ලදී. | ප්‍රත්‍යාගනය සිදු කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කල යුතුයි |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුහුණු වැඩසටහනක් සඳහා මැලේසියාවේ පුත්‍රජයා විශ්වවිද්‍යාලයට වැඩිපුර ගෙවන ලද රු. 219,007 (U.S.D. 1400) ක මුදල ආපසු එවා තිබූ අතර එම වටිනාකම පුහුණු වැඩසටහන් වියදම් ගිණුමට බැර කිරීම වෙනුවට විවිධ ආදායම් ගිණුමට බැර කිරීම හේතුවෙන් පුහුණු වැඩසටහන් වියදම සහ විවිධ ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම් ගත වී තිබුණි. | 2019 වර්ෂයේදී මෙවැනි අතපසුවීම් මගහරවා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. |
| (ආ)වටිනාකම රු. 416,109 ක් වූ භෞතිකව නොපවතින වත්කම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පිරියත හා උපකරණ වටිනාකම තුල ඇතුලත් වී තිබුණි. | 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල සහ භෞතිකව ඇති භාණ්ඩ සන්සන්දනය කර මූල්‍ය ප්‍රකාශන නිවැරදි කර ගැනීමට උපදෙස් දෙන ලදී. | වත්කම් ගිණුම්ගත කිරීමේදී ඒවායෙහි භෞතික පැවැත්ම පිළිබඳ අවධානය යොමුකල යුතුයි. |
| (ඇ)සමාලෝචිත වර්ෂයේදී රු. 271,262 ක් වැය කර මිලදී ගන්නා ලද පරිගණක මෘදුකාංගවල වටිනාකම ජංගම නොවන වත්කම් ලෙස හඳුනාගත යුතු වුවද වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2019 වර්ෂයේදී මෙම වියදම, වියදම් වලින් ඉවත් කර ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කිරීමට සහ මෙවැනි වැරදි තව දුරටත් සිදුනොවන ලෙසට කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. |
| (ඈ) සභාව වෙත ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන වලින් රු. 9,048,188 ක් සංවර්ධන වැය වෙනුවෙන් ගෙවීම් කර තිබුණද මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්තන ස්වභාවයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු. 6,245,189 ක් පමණක් දක්වා තිබුණි. | මෙම වරද ජර්නල් සටහන් මඟින් නිවැරැදි කිරීමට උපදෙස් දෙන ලදී. | අවශ්‍ය ගැලපීම් සිදුකර ඉදිරි වර්ෂයේදී නිවැරැදිව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) 2016 වර්ෂයේ ශ්‍රම වෙළඳපල සමීක්ෂණ (Labour Market Survey) වාර්තාවක් සකස් කිරීම සඳහා රු. 250,000 ක මුදලක් වෙන් කර අදාල කාර්යය කොළඹ විශ්ව විද්‍යාලයට පවරා ඇතත් එම කාර්යය ඉටු නොවන බව තහවුරු කරගෙන තිබුණද ඒ සඳහා වෙන්කරන ලද මුදල වර්ෂ දෙකකට වැඩි කාලයක සිට බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2019 වර්ෂයේදී මෙම වෙන් කිරීම මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට එකඟ වෙමි. | පිළිතුරෙහි සඳහන් පරිදි මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කිරීම සහ අදාල කටයුත්ත සුදුසුකම් ලත් පාර්ශවයක් මගින් ඉටුකර ගැනීම කෙරෙහි කළමණාකරණයේ අවධානය යොමු විය යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ)ප්‍රාග්ධන ප්‍රධාන තුලින් මිලදී ගත් වත්කම් වලට අදාල ක්‍රමක්ෂය වටිනාකම පමණක් විලම්භිත ආදායම් ලෙස වර්ෂයේ ආදායමට හඳුනාගත යුතු වුවත්, සභාව විසින් එකතුව රු. 4,101,235 ක් වූ වර්ෂයට අදාල සම්පූර්ණ ක්ෂය ප්‍රමාණයම ආදායමට හඳුනාගෙන තිබුණි. | ප්‍රාග්ධන ප්‍රධානයන්ගෙන් මිලදීගත් වත්කම් හඳුනා ගැනීම සඳහා තොරතුරු සභාව සතුව නොතිබුණු බැවින් වර්ෂයට අදාල සම්පූර්ණ ක්ෂය ප්‍රමාණයම ආදායමට හඳුනාගෙන ඇත. | රජයේ ප්‍රාග්ධන ප්‍රධාන තුලින් මිලදී ගත් වත්කම් වෙන්ව හඳුනාගත හැකිවන පරිදි ලේඛන නඩත්තු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 ඡේදය | සභාව විසින් සැලසුම් කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා සභා රැස්වීම් මාසිකව පැවැත්විය යුතු වුවත් 2018 වර්ෂය තුළ රැස්වීම් 4 ක් පමණක් පවත්වා තිබුණි. එම රැස්වීම්ද ඉහත කී චක්‍රලේඛයේ 4 ඡේදයේ සඳහන් අවශ්‍යතා ඉටුවන පරිදි ඵලදායීව පවත්වා නොතිබුණි. | 1997 අංක 18 දරන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව, නිල බලයෙන් පත්වන නිළධාරියා රැස්වීමට සහභාගී විය යුතුව ඇත. ප්‍රායෝගික තත්ත්වයන් මත සියලුම නිළධාරීන් සහභාගී කරවීම අසීරු වී ඇත. මේ සඳහා විසඳුමක් ලෙස පාලක මණ්ඩල සංයුතිය වෙනස් කිරීම සඳහා පනත සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී. | රටෙහි මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීමට හැකිවන පරිදි ජාතික තලයේ ක්‍රියාත්මක වන මෙම ආයතනය ආරම්භ කිරීමේදී එහි වැදගත් ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි රාජ්‍ය ආයතන වල ඉහලම ස්ථරයේ නිළධාරීන් පාලක මණ්ඩලය සඳහා යෝජනා වී ඇති බව නිරීක්ෂණය වේ. පිළිතුරෙහි සඳහන් පරිදි සහ සංයුතිය සංශෝධන කිරීමේදී ඉහත කී ජාතික වැදගත්කම පිළිබඳ අවධානය යොමුවිය යුතුය. |
| (ආ)1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ, ශ්‍රී ලංකා ජාතික සභා පනතේ 14 (I) ඡේදය | මානව සම්පත් සංවර්ධනය කිරීමේ සැලසුම් හා වැඩසටහන් ආණ්ඩුවට ඉදිරිපත් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්ද, ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද සභාව විසින් අමාත්‍යවරයාට උපදෙස් හා නිර්දේශ ලබා දිය යුතු වුවත් නියැදි පරීක්ෂාවට භාජනය වූ 2016, 2017 හා 2018 වර්ෂයන්හිදී සිදු කරනු ලැබූ ව්‍යාපෘති සම්බන්ධයෙන් එවැන්නක් සිදු වී නොතිබුණි. | සභාව විසින් සකස් කරන සෑම යෝජනාවකට අදාල සාකච්ඡා සඳහා විෂය භාර අමාත්‍යවරු සහභාගී වන අතර ඒ පිළිබඳව අග්‍රාමාත්‍යවරයාද දැනුවත් කර ඇත. එහෙත් ප්‍රායෝගික තත්ත්වයන් මත ඒ පිළිබඳ ලිඛිත තොරතුරු තබා ගැනීමට නොහැකි වී ඇත. කෙසේ වුවද ඉදිරියේදී අදාල ලිඛිත සාක්ෂි තබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | සභාව විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන්වල අවසාන අරමුණ ළඟා කර ගැනීම සඳහා විෂය භාර අමාත්‍යවරුන් දැනුවත් කිරීම සහ ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය වෙනුවෙන් අවශ්‍ය උපදෙස් ලබා දීම කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 5,596,047 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 4,167,580 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,428,467 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විදේශ පුහුණු වැඩසටහන් වලින් ලද ඉපයීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.1, 264,793 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සභාවේ ආදායම රු. 3,250,808 කින් වර්ධනය වී ඇති අතර එම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණේ රජයේ ප්‍රදාන රු. 2,866,786 කින් සහ විදේශ පුහුණු වැඩසටහන් වලින් උපයන ලද ආදායම රු. 1,264,793 කින් වැඩිවීමය. පෙර වර්ෂයේ වත්කම් ඉවත් කිරීමෙන් රු.1,068,524 ක අලාභයක් සිදුවී තිබුණද සමාලෝචිත වර්ෂයේ එම ප්‍රමාණය රු. 177,461 දක්වා අඩුවී තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන තුලින් කරන ලද වියදම රු. 2,320,569 කින් සහ උපයෝගී සේවාවල වියදම රු. 1,012,829 කින් වැඩි වී තිබුණද ක්ෂයවීම් හා නඩත්තු වියදම් පිළිවෙලින් රු. 1,588,611 කින් සහ රු.409,121 කින් අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු. 3,000,000 ක දායක ප්‍රාග්ධන වටිනාකම කුමන ප්‍රභවයකින් ලැබුණේද යන්න තහවුරු කර ගැනීමට අදාල තොරතුරු වාර්තාවී නොතිබුණි. | ආයතනයේ දැනට සිටින නිළධාරීන්ට මේ පිළිබඳ තොරතුරු ලැබී නැත. මේ සම්බන්ධයෙන් තවදුරටත් තොරතුරු පරීක්ෂා කිරීමට උපදෙස් ලබාදී ඇත. | මේ පිළිබඳ තොරතුරු පරීක්ෂා කර විගණනය වෙත වාර්තා කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ, ශ්‍රී ලංකා ජාතික සභා පනතේ ඡේද අංක 16 (2) (1) (ඒ) මගින්, මානව සම්පත් සංවර්ධනයේ විවිධ අංශවල නිපුණ විශේෂඥ සංචිතයක් සංවර්ධනය කිරීම අරමුණු කරගෙන සභාවේ නිළධරයන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමේ බලය සභාව වෙත පැවරී තිබුණි. එහෙත් එම කටයුත්ත සිදු නොකර බාහිර විශේෂඥ සේවා ලබාගැනීම වෙනුවෙන් වාර්ෂිකව සැලකිය යුතු මුදලක් වැය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුලදී පමණක් රු.1,262,025 ක් වැයකර තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ආරම්භ කිරීමේ අරමුණ ඉටකර ගැනීම සඳහා විවිධ අංශවල නිපුණ විශේෂඥ සංචිතයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය බැවින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2014 වර්ෂයේ සකස් කරන ලද ව්‍යාපෘති යෝජනාවක් අනුව විද්‍යුත් ලිපි කළමනාකරණ පද්ධතියක් සකස් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය නිමවන විට ඒ සඳහා රු.106,050 ක් වැයකර තිබුණි. එහෙත් එම වැඩසටහන සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. | සේවකයන්ගේ පරිගණක තාක්ෂණික දැනුම ප්‍රමාණවත් නොවීම, පුහුණු නිලධාරීන් ආයතනය හැරයාම, විද්‍යුත් ලිපි සහ Digital Signatures රජයේ ආයතන පිළිගැනීමට මැලිකමක් දැක්වීම වැනි හේතු අනුව මෙම පද්ධතිය සැලසුම් කළ පරිදි පවත්වාගෙන යාමට බාධාවක් වී ඇත. | ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේදී එම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට ඇති බාධාවන් පිළිබඳ අවධානය යොමු විය යුතුය. |

### 3.3 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ත්‍රී රෝද රථ රියදුරන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් හඳුනා ගැනීම ඇතුලු අරමුණු 05 ක් මුල් කරගෙන සමීක්ෂණයක් පැවැත්වීමට සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට රු. 818,399 ක් වැය කර තිබුණි. එම සමීක්ෂණයට අදාල වාර්තාව සැකසීමේ කටයුතු වෙනුවෙන් විධිමත් ක්‍රමවේදයකින් තොරව පත් කරන ලද උපදේශකවරියක් වෙත රු. 60,000 ක් ගෙවා තිබුණි. එහෙත් අදාල සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් නොවුන අතර එම වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කිරීමට වැඩපිළිවෙලක් නොවූ බැවින් වැය කරන ලද රු.878,399 ක මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි. | පර්යේෂණය මගින් ලබා දී ඇති නිර්දේශයන්ට අනුව සංචාරක ක්ෂේත්‍රයේ ත්‍රීවිල් රථ රියදුරන් සහතික කිරීමේ වැඩපිළිවෙලක් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් ආරම්භ කරනලද අතර දැනට එය ක්‍රියාත්මක වේ. ඒ සඳහා වෘත්තියේ නියැලි අය සඳහා වැඩමුළුවක්ද පවත්වනු ලබයි. | සභාව විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන් වල ප්‍රගතිය පසුවිපරම් කිරීමේ වැඩපිළිවෙලක් තිබිය යුතු අතර වැයකල මුදලට සරිලන ප්‍රතිලාභ ලැබීම් පිළිබඳ විශේෂ අවධානය යොමුවිය යුතුය. |

### 3.4 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 ඔක්තෝබර් 05 දින අනතුරට ලක්වූ මෝටර් රථයට සිදු වී තිබූ රු. 920,885 ක අලාභය සම්බන්ධයෙන් 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PFD/RED/2015/08 පොදු (i) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජෙනරාල්ගේ ලිපියෙහි 4.1 (අ) (ii) ඡේදය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි පත් කළ ස්වාධීන පරීක්ෂණ මණ්ඩලයකින් ඊට අදාලව පරීක්ෂණයක් සිදු කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම අලුත්වැඩියාවට අදාලව රක්ෂණ සංස්ථාව මඟින් රු. 86,039 ක මුදලක් ටොයෝටා ලංකා ආයතනයට ගෙවා ඇත. ඉතිරි මුදල වාහනය මිලදීගෙන අවුරුදු 05 ට වඩා වැඩි නිසා ගෙවීමට නොහැකි බව දන්වා ඇත. මෙම ගෙවීම් සිදුකිරීම නිසා රක්ෂණ වාරිකය වැඩිවීමත් ප්‍රසාද දීමනාව අහිමි වීමත් සිදු වී ඇත. | මෙම අනතුර හේතුවෙන් රජයට සිදු වූ පාඩුව ආවරණය කර ගැනීමට කටයුතු කල යුතුය. |

අධිකරණ තීන්දුව මගින් බාහිර පාර්ශවකරුවෙකු වරදකරු බවට ඔප්පු වී තිබුණද, සිදු වී ඇති අලාභය එම පාර්ශවයෙන් අයකර ගැනීමට කටයුතු නොකර සභාවේ රක්ෂණ ආවරණය මගින් රු. 834,846 ක් පියවා ගෙන තිබුණි. ඒ අනුව වාහනයේ රක්ෂණයට අදාලව හිමිකම් නොපෑමේ ප්‍රසාද දීමනාවද අහිමි වී තිබූ අතර රක්ෂණයෙන් ප්‍රතිපූරණය නොවූ රු.86,039 ක අලුත්වැඩියා වියදම සභාව විසින් ගෙවා තිබුණි.

**3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සභාව විසින් රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා විදේශීය පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය සිදුකර ලාභ ඉපයීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඉන් සමාලෝචිත වර්ෂයේ රු. 8,126,660 ක ආදායමක් උපයා තිබුණි. 2017 දෙසැම්බර් 18 දිනැති අංක BD/HR 104/NHRDC/09/33 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් ඉහත කී අතිරික්ත මුදල් රජයේ ආදායමට බැර කරන ලෙස දන්වා තිබුණද එසේ කර නොතිබුණි. | මෙම වැඩසටහන විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | මෙම කටයුත්ත සභාවෙහි අරමුණුවලට අදාල නොවන බැවින් එය ඉදිරියට කරගෙන යාම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ උපදෙස් හා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 නොවැම්බර් 06 දිනැතිව අංක DPMM/DG/037 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය මගින්, රාජ්‍ය ආයතන විසින් තම ඉලක්කයන් ලගාකර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් හඳුනා ගෙන ඒවායෙහි නිමැවුම (output) සහ ප්‍රතිඵලය (outcome) මැනිය හැකි වන පරිදි මූලික කාර්යය සාධන | 2020 වර්ෂයේදී ආයතනික ප්‍රතිඵල රාමුවක් (Organizational results frame work) සකස් කිරීම සඳහා අදාල නිළධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | දී ඇති උපදෙස් පරිදි ආයතනික ප්‍රතිඵල රාමුවක් සකස් කර අඛණ්ඩව කාර්යසාධනය මැනිය හැකි වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| දර්ශක ස්ථාපිත කිරීමට සහ ඒ අනුව අඛණ්ඩව කාර්යසාධනය මැනිය හැකි වන පරිදි ආයතනික ප්‍රතිඵල රාමුවක් (Organizational results frame work) සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ ලබා දී තිබුණි. එහෙත් සභාව විසින් එම උපදෙස් පරිදි කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් එකතුව රු.1,050,000 ක ප්‍රතිපාදන වෙන් කරන ලද වැඩ සටහන් 02 ක් වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණු අතර සභාව විසින් සකස් කර තිබූ ක්‍රියාකාරී සැලසුමෙහි කාර්යසාධන දර්ශකයන් සහ නිමැවුම සහ ප්‍රතිඵල පැහැදිලිව නොතිබුණු බැවින් සහ වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි මූල්‍ය කාර්යසාධන දත්ත (Financial performance) ඇතුළත් කර නොතිබුණු බැවින්, 2018 වර්ෂයේ සභාවෙහි සමස්ථ කාර්යයසාධනය පිළිබඳ ඇගයීමක් කළ නොහැකි විය. | ඉදිරි වර්ෂයේදී නිසිපරිදි සැලසුම් සකස් කිරීමට සහ අපේක්ෂිත කාර්යයසාධනය ලඟාකරගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තාත්වික පදනමින් සකස් කළ යුතු අතර කාලීනව සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන ඇතුලත් කර සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනය කරනු ලබන අස්ථිත්‍යයන්හි අභ්‍යන්තර විගණනය සිදු කිරීම සඳහා එම අස්ථිත්‍යයේ පාලක මණ්ඩලය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂය නිම වන විටත් සභාවෙහි අභ්‍යන්තර විගණනය සිදුකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශයෙන් අභ්‍යන්තර විගණන නිළධාරියෙක් පත් කරන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව අමාත්‍යාංශ උපදෙස් අනුව ඉදිරි පියවර ගනිමින් පවතී. | සභාවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය. |